# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2420/37 - 2025 ජනවාරි මස 22 වැනි බදාදා - 2025.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාර ගෙන නොමැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාව මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල සම්බන්ධයෙන් පමණක් මෙම නියමය මඟින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/324.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/KB/16.

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 576A, තුම්බෝව්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තුම්බෝව්ල (කොට්ඨාස අංක 10 තුම්බෝව්ල කැස්බෑව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2024/98 හා 2024.08.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම් :

01. **කැබලි අක්ෂර 'B' - දූවවත්ත - ප්‍රමාණය - හෙක්: 0.0887**

උතුරට: කැබලි අක්ෂර A, ක.සි 521203 කලාප 16 පත්‍ර 2 හි කැබලි අංක 114, පත්‍ර 1 හි කැබලි අංක 53 සහ පත්‍ර 2 හි කැබලි අංක 111; නැගෙනහිර: ක.සි 521203 කලාප 16 පත්‍ර 2 හි කැබලි අංක 114, පත්‍ර 1 හි කැබලි අංක 53, පත්‍ර 2 හි කැබලි අංක 111, 110 සහ 109; දකුණට: ක.සි 521203 කලාප 16 පත්‍ර 2 හි කැබලි අංක 109, 93 සහ 113; බටහිරට: ක.සි 521203 කලාප 16 පත්‍ර 2 හි කැබලි අංක 113, 93 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A.

EOG 01 - 0223



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 නොවැම්බර් මස 07 වැනි දින අංක 1887/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2014 අංක 308 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/324.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/KB/16.

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛණය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 576A, තුම්බෝවිල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තුම්බෝවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 521203 හා 2016.05.23 දිනැති කැඩැස්තර සිතියමේ කලාප අංක 17 න් 02 කලාපය, පත්‍ර අංක 04 හි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම් :

01. **කැබලි අංක 522 - මාවීකොටුව - ප්‍රමාණය - හෙක්: 0.0244**

උතුරට: කැබලි අංක 523; නැගෙනහිරට: කැබලි අංක 520; දකුණට: කැබලි අංක 521; බටහිරට: කැබලි අංක 530.

EOG 01 - 0224

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.